රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site


---

මගේ අංකය / எனது இல / My No: DG/Policy/2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.05.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ඒකාබද්ධ සේවයේ නිලධාරින් විශ්‍රාම ගැන්වීම සඳහා වූ ඉල්ලීම් විද්‍යුත් තැපැල (E-mail) මගින් යොමු කිරීම.</u>**

ඒකාබද්ධ සේවයේ නිලධාරින් විශ්‍රාම ගැන්වීම සඳහා වූ ඉල්ලීම් මාර්ගගතව යොමු කිරීම සඳහා යෝජිත තොරතුරු තාක්ෂණ වැඩසටහන හඳුන්වා දෙන තෙක් එම ඉල්ලීම් **විද්‍යුත් තැපැල** මගින් ඒකාබද්ධ සේවා අංශය වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. ක්‍රමවේදය - විද්‍යුත් තැපැල

2.1 විශ්‍රාම ගැන්වීම සඳහා වූ ඉල්ලීම් මේ සමග අමුණා ඇති **CS-Ret-App-2020** ආකෘති පත්‍රය යටතේ පමණක් සකස් කල යුතු අතර අත්‍යාවශ්‍ය ලෙස හඳුනාගත් සීමිත ලිපි ලේඛන පමණක් ඒ සමග එක්කල හැකිය.

2.2 නිවැරදිව සම්පූර්ණ කරන ලද ආයතන ප්‍රධානී/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ අමාත්‍යාංශ ලේකම් නිර්දේශිත විශ්‍රාම ගැන්වීමේ ඉල්ලීම හා අත්‍යාවශ්‍ය ලිපි ලේඛන PDF හෝ JPEG ආකෘති බවට පරිලෝකනය කර විශ්‍රාම යාමට නියමිත නිලධරයා අයත් සේවය, ශ්‍රේණිය අනුව පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයන්ට අමුණා යොමුකල යුතුය.

| සේවය | කෙටි යෙදුම | ශ්‍රේණිය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|---|
| කළමනාකරණ සේවා නිලධාරි | PMOS | I | adcs-i@pubad.gov.lk |
| | | II/ අධි | adcs-ii@pubad.gov.lk |
| | | III | adcs-iii@pubad.gov.lk |
| කාර්යාල සේවක | OES | | adcs-v@pubad.gov.lk |
| රජයේ භාෂා පරිවර්තක<br>ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති<br>ඒකාබද්ධ රියදුරු | TS<br>LS<br>DS | | adcs-vi@pubad.gov.lk |
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ | ICTS | | adcs-vii@pubad.gov.lk |
| සංවර්ධන නිලධාරි | DOS | | adcs1-dos@pubad.gov.lk |

2.3 මෙසේ යොමුකරනු ලබන සියලු ලිපි ලේඛන **පැහැදිලිව හඳුනාගත හැකි අවම ධාරිතාවක් සහිත** PDF හෝ JPEG ආකෘති බවට පරිලෝකනය කලයුතු අතර එක් විද්‍යුත් තැපැල් පණිවුඩයක් සඳහා **උපරිම ලෙස 3MB** ධාරිතාවක් වෙන්කර ඇත.

2.4 විද්‍යුත් තැපැල් විෂයය (Subject) ලෙස ***"RET - සේවයට අදාල කෙටි යෙදුම - මුලකුරු සමග නිලධරයාගේ නම - ජාතික හැඳුනුම්පත් අංකය"*** යෙදීම අනිවාර්යය වේ.

උදා:- **RET - ICTS - A.B.C. SILVA - 630261632V**

03. දැනටමත් ඉදිරිපත් කර ඇති විශ්‍රාම ගැන්වීම් සඳහා වූ ඉල්ලීම් නැවත මෙම ආකෘතිය මගින් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව ද, එම ඉල්ලීම් සහ මෙම ආකෘතියෙන් ඉදිරිපත් කරන ඉල්ලීම් විධිමත් අනුමැතියෙන් අනතුරුව අදාල විශ්‍රාම ගැන්වීමේ ලිපි, PDF හෝ JPEG ආකෘති බවට පරිලෝකනය කර ආයතනික නිල විද්‍යුත් තැපැල වෙත යොමු කිරීමට ඒකාබද්ධ සේවා අංශය විසින් කටයුතු කරනු ඇත.

04. ඒකාබද්ධ සේවයේ නිලධාරින්ගේ විශ්‍රාම ගැන්වීමේ ඉල්ලීම් සම්බන්ධයෙන් විද්‍යුත් තැපැල භාවිතා කිරීමේ යම් අපහසුතාවයක් පවතී නම් ඒ සඳහා 011- 269 2254 දරණ ෆැක්ස් අංකය භාවිතා කළ හැකි බව වැඩිදුරටත් දන්වමි.

**එස්. ආලෝකබණ්ඩාර**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**CS-Ret-App-2020**

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07

## <u>ඒකාබද්ධ සේවයේ නිලධාරීන් විශ්‍රාම ගැන්වීම සඳහා වූ ඉල්ලීම</u>

විශ්‍රාම ගැන්වීමේ ඉල්ලීම ඉදිරිපත් කරන විට නිලධරයා සේවයේ යෙදී සිටින සේවා ස්ථානය: .............
...............................................................................................................................

### I කොටස - නිලධරයා විසින් සම්පූර්ණ කල යුතුය

i. මුලකුරු සමග නම: ........................................................................................................
ii. සම්පූර්ණ නම: ..............................................................................................................
iii. ජාතික හැඳුනුම්පත් අංකය: ...............................................................
iv. සේවය: ............................................................ පන්තිය: ............... ශ්‍රේණිය: .................
v. උපන් දිනය: ..................................... විශ්‍රාම යාමට ඉල්ලුම් කරන දිනට වයස: ..................
vi. මුල් පත්වීමේ දිනය: ............................ සේවය ස්ථිර කිරීමේ දිනය : ..................................
vii. දුරකථන අංක: ජංගම: ........................... ස්ථාවර: ...........................
viii. අදාල පරිදි ☑ සලකුණ යොදන්න

අ) විශ්‍රාම ගැන්වීමේ අනිවාර්ය වයසට (අවුරුදු 60) එළඹීම මත ☐
ආ) විශ්‍රාම ගැන්වීමේ වෛකල්පිත වයසට (අවුරුදු 55) එළඹීමෙන් පසු ☐
ඇ) අවුරුදු 20ක දළ සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත ☐
[රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88, 30/88(i) අනුව]
ඈ) වෛද්‍ය මණ්ඩල තීරණ යටතේ වූ නිර්දේශ මත ☐

වර්ෂ 20.......... වූ ........................ මස ............ දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමැත්ත පල කරන අතර, ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය: ....................................                ......................................................
**අයදුම්කරු** (අත්සන)

### II කොටස - ආයතන ප්‍රධානි/ දෙපාර්තමේන්තු ප්‍රධානි/ අමාත්‍යාංශ ලේකම් නිර්දේශය

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්/ රාජ්‍ය පරිපාලන ලේකම්

1. ...................................................................................................... මහතා/ මිය/ මෙනවිය ගේ

| | | ඇත | නැත | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| I | සේවය ස්ථිර කර ( දිනට) | | | |
| II | පත්වීම් ලිපිය අනුව විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය කර | | | |

2. මෙම නිලධරයා සම්බන්ධයෙන් විශ්‍රාම ගැන්වීමට බාධාවක් වන.

| | | ඇත | නැත |
|---|---|---|---|
| I | විගණන විමසුම් | | |
| IIඅ | විනය ක්‍රියාමාර්ග ආරම්භ කර | | |
| IIආ | මූලික විමර්ශනයන් ආරම්භ කර | | |
| III | සාපරාධී වැරදි සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පවරා | | |
| IV | අනිවාර්යය සේවා කාලයක්/ ඇපකර/ බැඳුම්කර | | |
| | | | |

3. ඒ අනුව මෙම නිලධරයා
(අදාල පරිදි ☑ සලකුණ යොදන්න)

අ) විශ්‍රාම ගැන්වීමේ අනිවාර්ය වයසට (අවුරුදු 60) එළඹීම මත ☐
ආ) විශ්‍රාම ගැන්වීමේ වෛකල්පිත වයසට (අවුරුදු 55) එළඹීමෙන් පසු ☐
ඇ) අවුරුදු 20ක දළ සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත ☐
[රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88, 30/88(i) අනුව]
ඈ) වෛද්‍ය මණ්ඩල තීරණ යටතේ වූ නිර්දෙශ මත ☐
ඉ) වෙනත් ☐
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ පරිච්ඡේදයේ නියමයන් ප්‍රකාරව, රජයේ සහ අධිකරණ නිලධාරින් විශ්‍රාම ගැන්වීමේ ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ සම්පාදිත නීති අනුකූලව වර්ෂ 20.......... වූ ............... මස ............ දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වීම නිර්දේශ කරමි.

දිනය: .......................................

..........................................................................
**ආයතන ප්‍රධානි/ දෙපාර්තමේන්තු ප්‍රධානි/ අමාත්‍යාංශ ලේකම්**
(අත්සන/ නිල මුද්‍රාව)